අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/59/03/02/01
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2019.02..19

අමාත්‍යාංශ චක්‍රලේඛ : 10/2019

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්

සියලුම පීඨාධිපතිවරුන් වෙත

**<u>ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම.</u>**

අංක 1925/37 හා 2015.07.28 දිනැති ගැසට් පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන් සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධානයන් අදාළ කරගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇති බව දන්වා සිටිමි.

I. අංක 1070/13 හා 1999.03.11 දිනැති පැරණි සේවා ව්‍යවස්ථාවට අනුව 3 පන්තියට බඳවා ගනු ලැබූ පළමු කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ නොකිරීම මත වැටුප් වර්ධක විලම්භනය කර ඇති නිලධාරීන්ගේ වැටුප් වර්ධක, එම නිලධාරීන් අංක 1925/37 හා 2015.07.28 දිනැති නව සේවා ව්‍යවස්ථාවේ පළමු කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කරන තුරු විලම්භනය කල යුතුය.

II. අංක 1070/13 හා 1999.03.11 දිනැති පැරණි සේවා ව්‍යවස්ථාවට අනුව 3 පන්තියට බඳවා ගනු ලැබූ, දෙවන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ නොකිරීම මත වැටුප් වර්ධක විලම්භනය කර ඇති නිලධාරීන්ගේ වැටුප් වර්ධක නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක 2015.07.28 දින සිට නැවත ගෙවිය යුතුය.

III. අංක 1070/13 හා 1999.03.11 දිනැති පැරණි සේවා ව්‍යවස්ථාවට අනුව 3 පන්තියට බඳවා ගනු ලැබූ සන්ධාන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ නොකිරීම මත 2 – II ශ්‍රේණියට උසස් නොකරන ලද, උසස්වීම් නොලද තීරුවේ උපරිමයේ රැඳී සිටීම මත වැටුප් වර්ධක නොලද නිලධාරීන් එකී සේවා කාලය තුළ සතුටුදායක හෝ ඊට ඉහළ මට්ටමක කාර්ය

සාධනයක් ලබාගෙන තිබේ නම් එම සේවා කාලය සතුටුදායක සේවා කාලයේ කොටසක් ලෙස සැලකිය යුතුය.

IV. අංක 1070/13 හා 1999.03.11 දිනැති පැරණි සේවා ව්‍යවස්ථාවේ 18 වන වගන්තිය අනුව 2 - II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන් එම සේවා ව්‍යවස්ථාවේ 2 – II ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම වන ලිඛිත විභාගය සම්පූර්ණ කර ඇත්නම් එම නිලධාරීන් අංක 1925/37 හා 2015.07.28 දිනැති නව සේවා ව්‍යවස්ථාවේ II ශ්‍රේණියේ නිලධාරීන්ට අදාළ දෙවන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර ඇති නිලධාරීන් ලෙස සලකා කටයුතු කල යුතුය.

V. අංක 1070/13 හා 1999.03.11 දිනැති පැරණි සේවා ව්‍යවස්ථාවට අනුව 2000/2001 වර්ෂයන්හීදී 3 පන්තියට බඳවාගනු ලැබූ නිලධාරීන් හට අදාළ විෂයය ක්ෂේත්‍රයන් ප්‍රමාද වී ලබා දී ඇති බැවින් මත එම නිලධාරීන්ට පමණක් පෞද්ගලික වන සේ " අධ්‍යාපනය හෝ අදාළ විෂය පිළිබඳව වන පශ්චාත් උපාධියක් ලබා තිබීම" යන සුදුසුකම වෙනුවට එම නිලධාරීන් ලබා ඇති පශ්චාත් උපාධි සුදුසුකම උසස්වීමේ සුදුසුකම ලෙස සැලකිය යුතුය.

මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව නිකුත් කරනු ලැබේ.

පද්මසිරි ජයමාන්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය